මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වසුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල වසුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

(අ) යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය 1,586 ක්, වාහන 115 ක් සහ ඉන්ධන ලීටර් 83,277 ක්, වර්ග අඩි 249,074 ක ගොඩනැගිලි, ඉඩම් අක්කර 113 රූඩ් 2 පර්චස් 36 ක් සහ වෙනත් වත්කම් අයිතම 1,013 ක් ඇතුළු යුද්ධ හමුදා සම්පත් යොදාගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වා ගෙන යනු ලබන යුද්ධ හමුදා ගොවිපල 18 ක්, සුභසාධන හෝටල් 05 ක් ඇතුළු විවිධ ආදායම් උත්පාදන ව්‍යාපෘති තුලින් 2024 වර්ෂයේ රු.මිලියන 1,357ක් හා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,753 ක ආදායමක් උපයා තිබුණද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ බදු නොවන ආදායම් ලැබීම් හා වෙනත් ලැබීම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2025 මාර්තු 05 දිනැති හා අංක PFD/RED/REG/F&C/2025/DEF දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛ ප්‍රකාරව සන්නිවේදන කුළුණු ආදායමින් සියයට සියයක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. 2026 අප්‍රේල් 24 දිනැති අංක ප්‍රසංනිකා/ප්‍ර/එස්වයි/21/2026 (31) දරන ලිපියෙන් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද වටිනාකම රු.මිලියන 27 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කළ සටහන් අංක 9 හි ඒකාබද්ධ අරමුදලට බැර කළ සන්නිවේදන කුළුණු ආදායම රු.මිලියන 25 ක් ලෙස රු. මිලියන 2 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 පුනරාවර්තන වියදම්

(අ) 222 වැය ශීර්ෂය යටතේ සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 229 ක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රාදේශීය ගණකාධිකරණ කාර්යාල අටක් මඟින් වියදම් කර තිබුණි. ඉන් සියයට 72 ක් වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ද, සියයට 6 ක් හමුදා මූලස්ථාන මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින්ද, ඉතිරි ප්‍රතිපාදන සියයට 1 සිට සියයට 5 දක්වා ප්‍රතිශත සෙසු අධ්‍යක්ෂ මණ්ඩල විසින් ද වියදම් කර තිබුණි. ගණකාධිකරණ සේවයේ නිලධාරීන්ගෙන් සමන්විත තනතුරු 07 න් සියයට 06 ක හමුදා මූලස්ථාන ගෙවීම් සහතික කිරීම වෙනුවට ප්‍රාදේශීය ගණකාධිකරණ කාර්යාල ප්‍රතිපාදන වැය කිරීම් ප්‍රතිශත අනුව අනුයුක්ත කිරීම් කර නොතිබුණි. ඒ අනුව රු.බිලියන 206 කට ආසන්න වියදම් සහතික කිරීම ගණකාධිකරණ සේවයේ නිලධාරීන් මඟින් ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද තොරතුරු අනුව ඉන්ධන වැය විෂය යටතේ වැය කර ඇති සත්‍ය වියදම රු.මිලියන 5,139 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි ගිණුම් ගත කර ඇති වියදම රු.මිලියන 5,862 ක් වූයෙන් ගිණුම් ගත කර ඇති වියදම හා සත්‍ය වියදම් අතර රු.මිලියන 723 ක විචලනයක් පැවතුණි. දර හා ගෑස් වියදම් ගිණුම්ගත කිරීමේදී ඉන්ධන හා ආහාරපාන හා නිල ඇඳුම් වැය විෂයයන් යොදා ගැනීම් ගැටළුකාරී බව වාර්තා කර තිබුණද එම ගැලපීම් සිදු කිරීමෙන් පසුවද වෙනස්කම් පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා වාර්ෂිකව සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්මෙහි පුනරාවර්ථන වියදම් සඳහා වන ක්‍රියාකාරකම් සැලැස්ම අනුව ඉන්ධන වැය විෂය යටතේ දක්වා ඇති වියදම් වල අපේක්ෂිත ප්‍රතිඵලය වාහන හා යන්ත්‍රෝපකරණ සාමාන්‍ය ලෙස ධාවනය කිරීම වන අතර ධාවනය කරන දුර කිලෝ මීටර

ප්‍රමාණය මඟින් එය මිනුම් කරන බව දක්වා ඇත. නමුත් එම ක්‍රමවේදය තවම සංවර්ධනය කරමින් පැවතුණි.

### 1.6.3 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ SA 10 භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 2,646 ක් විය. නමුත් SA 100 භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය (ශේෂ පිරික්සුම) හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසිඒ 06) වත්කම් කාණ්ඩ 05 කට අදාළව වත්කම් වර්ග 22 ක මිලට ගැනුම් වටිනාකම රු.මිලියන 2,008 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වියදම් ලෙස වාර්තා කර තිබූ රු.මිලියන 637 ක් සඳහා වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

### 1.6.4 තැන්පතු ගෙවීම්

භාණ්ඩාගාර පොදු තැන්පතු ගිණුමේ ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් ගිණුමෙහි 2025 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය රු.මිලියන 13 ක් වූ මුදල් ඉහල වටිනාකමක් ගෙන තිබුණද මුද්දර ගාස්තු ලෙස කඩිනමින් රාජ්‍ය ආදායමට බැර කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

### 1.6.5 අත්තිකාරම් ගෙවීම්

මුදල් රෙගුලාසි 503(1) අනුව සදොස් නොහොත් වැරදි සටහන් ගැළපුම් පිණිස කෙරෙන හර හා බැර අත්තිකාරම් ගිණුමේ සීමාවන් ඉක්මවීමක් හෝ පහත වැටීමක් සඳහා ගණනයට නොගත යුතුබව දක්වා ඇත. නමුත් යුද්ධ හමුදාව විසින් 2024 වර්ෂයේ ලබා දුන් රු.මිලියන 50 ක අක්මුදල නිවැරදි කිරීමට යොදන ලද සටහන ගැලපුම් ලෙස හෙළිදරව් නොකෙරෙන පරිදි සීමාවට බල නොපාන ලැබීමක් ලෙස සටහන් කළ යුතුව තිබුණි.

### 1.6.6 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්

(අ) යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.මිලියන 44,990 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් ගෙවීම් යටතේ ඇතුළත් කර තිබුණද වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් හා ඒ සඳහා ලද මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ලැබීමක් වශයෙන් සටහන් කර නොතිබුණි.

(ආ) යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය තුළ යුද්ධ හමුදා අරමුදල ඇතුළු විවිධ අරමුදල් උපයෝගී කරගනිමින් මිලදී ගැනීම් හා සේවා සැපයීම් සිදු කර එම වියදම් පසුව ප්‍රතිපූරණය කර තිබුණි. නමුත් එවැනි මූල්‍යයනයන් සඳහා අවසර ලබා ගැනීමක් හා ඒ අනුව මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ලැබීම් හා ගෙවීම් ප්‍රවාහ ඇතුළත් කිරීමට නෛතික ප්‍රතිපාදන ලබාගෙන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කර නොතිබුණි.

### 1.6.7 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කෙරිගෙන යන වැඩ ශේෂය යටතේ මිලදී ගැනීම් රු.මිලියන 294 ක් දක්වා තිබුණද ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද තොරතුරු අනුව එම අගය රු.මිලියන 370 ක් වූ අතර රු.මිලියන 76 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය (ඒසිඒ-6) අනුව 2025 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩ ශේෂය රු.මිලියන 3,847 ක් වුවත් 2026 පෙබරවාරි 24 දිනැති අංක ඉසේඅම/02/මූලධන/වි:වා/2026/01 දරන ලිපිය මඟින් ඉදිරිපත් කළ තොරතුරු අනුව වැඩ නිමකර නොමැති

ගොඩනැඟිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම් ශේෂය රු. මිලියන 716 ක් විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් රු.මිලියන 3,131 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ SA 10 භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් රු.මිලියන 2,646 ක් විය. නමුත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසිඒ 06) වත්කම් කාණ්ඩ 05 කට අයත් වත්කම් වර්ග 22 ක මිලට ගැනුම් වටිනාකම රු.මිලියන 2,008.7 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වියදම් ලෙස වාර්තා කර තිබූ රු.මිලියන 637.6 ක වැඩිවීමක් නිරීක්ෂණය නොවුණි.

(ඈ) ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා දුන් කැබ් රථ 20 හා ගිලන් රථ 04 හි පිරිවැය රු.මිලියන 150 හා එම වාහන නිරවුල් කිරීම සඳහා දරන ලද පිරිවැය රු.මිලියන 623 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 1.6.8 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

කොළඹ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සඳහා පුද්ගලික සමාගමට අයත් ගොඩනැගිල්ල 2025 සැප්තැම්බර් 14 දින සිට ඉදිරියට වසරක කාල සීමාවක් සඳහා මාසයකට රු.මිලියන 1.15 ක කුලී මුදලකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා මාස 06 ක අත්තිකාරම් ලෙස රු.මිලියන 6.9 ක් ගෙවිය යුතුව තිබුණි. නමුත් අත්තිකාරම් ලෙස රු.මිලියන 13.8 ක මුදලක් ගෙවා ඇති අතර එය මාස 12 ක කුලී මුලදට සමාන විය. ප්‍රවර්ථන වර්ෂයේ මාස තුනට අදාළව අයවිය යුතු මුදල රු.මිලියන 1.7 ක් වුවද ඒ වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයට අදාළව රු.මිලියන 8.63 ක් අයකර ඉතිරි ශේෂය රු.මිලියන 5.16 ක් ලෙස ගිණුමෙහි දක්වා තිබුණි.ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයට අදාළව රු.මිලියන 6.9 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.9 තැන්පතු ගිණුම් ශේෂ

භාණ්ඩාගාර ගිණුම් SA 30 අනුව යුද්ධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පතු ගිණුම් 05 ක ආරම්භක ශේෂ එකතුව රු.මිලියන 42 ක් වූ අතර දෙපාර්තමේන්තු පොත් අනුව එම එකතුව රු.මිලියන 31 ක් වූයෙන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ගිණුම් අතර රු.මිලියන 11 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.10 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විවිධ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන යුද්ධ හමුදාවට අයත් හා කුලී පදනම මත ලබාගෙන ඇති වාහනවල දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීමට අදාළ 2025 අප්‍රේල් 25 දිනැති අංක DEF/A/SLA/2024/20 දරන විගණන විමසුමෙහි ඡේද අංක 03 අනුව එකිනෙක සේනාංක /සංස්ථා/ඒකක හෝ වෙනත් ඕනෑම අංශයක් විසින් නඩත්තු කරනු ලබන යුද්ධ හමුදාව සතු සහ කුලී පදනම මත ලබාගෙන ඇති සියළුම වාහනවල යුහප්‍ර අංක 09, යු.හා.ප්‍ර 11 හා AFT 21 ආකෘතිපත් විගණනයට සුදානම් බව දක්වමින් සකස් කරන සාරාංශ ලිපිය දැනට නව තාක්ෂණික ආකෘතියකට අනුව සංශෝධනය වන බව දක්වා තිබුණද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වාහන උපයෝජනය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සාම සාධක මෙහෙයුම් සඳහා රු.මිලියන 300 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණු අතර ගිණුම් ප්‍රකාශන අනුව සත්‍ය වියදම් රු.මිලියන 2,220 ක් විය. විගණනයට ලබාදුන් තොරතුරු අනුව එම වියදම් රු.මිලියන 2,212 ක් වූයෙන් රු.මිලියන 8 ක වෙනසට හේතු අනාවරණය නොවුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයෙහි වාර්තාකිරීමේ පදනම් සටහන අංක 09 මඟින් ඉදිරිපත් කරන බව දක්වා තිබූ නීති කෘත්‍යයන් ලැයිස්තුව ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2025 ඔක්තෝබර් 10 දිනැති අංක TO/BE2/4/4/1/2022 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ලිපිය අනුව යුද්ධ හමුදාධිපති නමින් මහජන බැංකුවේ ආරම්භ කර ඇති මේ වන විට අක්‍රියව පවතින බැංකු ගිණුම් 03 ක් හා ලංකා බැංකුවේ ආරම්භක කර ඇති බැංකු ගිණුම් 03 ක් අවසන් කරන ලෙස අදාළ බැංකු කලමණාකරුවන්ගෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව විගණනයට ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් 13 ට අමතරව වෙනත් බැංකු ගිණුම් පවතින බව තහවුරු වන අතර, එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) රාජ්‍ය සේවයේ තනතුරුවල පදවි නාමය වෙනස් කිරීම, නව තනතුරු ඇති කිරීම, තනතුරු ශ්‍රේණි ගත කිරීම ආදිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් යුද්ධ හමුදාව තුළ මූල්‍ය කළමනාකරණ නමින් ශාඛාවක් ස්ථාපිත කර ඒ යටතට අධ්‍යක්ෂ මණ්ඩල 07 ක් පිහිටුවීමට අදාළව මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව ක්‍රියා කළ බවට තහවුරුවීමට අදාල ලිපි ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඊ) 2023 වර්ෂයේ රු.මිලියන 24 ක් වැය කර Heavy Duty Photocopy Machine 20 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයද ඇතුළත්ව යුද්ධ හමුදාව විසින් විවිධ අවස්ථාවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවී ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හේතුවෙන් රජයට සිදු වූ අලාභයන් සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී යුද්ධ හමුදා සේවයේ නොමැති පුද්ගලයන්ට සිවිල් නීතිය යටතේ කටයුතු කරන බවටත්, මේ සම්බන්ධයෙන් නීතිපති අදහස් විමසීමක් සිදු කරන බවටත් නීති අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පැවති සාකච්ඡාවේදී එකඟ විය. ඒ අනුව විගණන වාර්තාවල ඇතුළත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් වීතැන්වීම් වෙන් වෙන්ව නීතිපති විමසීම් වෙනුවට සාරාංශගත කර එකවර විමසිය යුතු බවට වූ එකඟතාවය මත මෙතෙක් ලබා ඇති ප්‍රගතිය හා එවැනි වීතැන්වීම්වලදී දැනට හමුදා සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(උ) යුද්ධ හමුදාධිපති අරමුදල හා හමුදාධිපති නිල නාමයෙන් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ඇති කිරීම සඳහා බලය ලැබුණු නෛතික ප්‍රතිපාදන , අරමුදල් සම්පාදනය කිරීමේ භාණ්ඩාගාර වගකීම ඉටුකිරීමට මෙම අරමුදලේ ප්‍රතිපාදන ලබාදීමට බලය පැවරූ නෛතික ප්‍රතිපාදන, ඒකාබද්ධ අරමුදලින් සිදු කළ යුතු වියදම් සඳහා ණය ලබා දීමේ නෛතික ප්‍රතිපාදන, වියදම් දරනු ලබන පාර්ශවය වෙනුවට අරමුදල් ගිණුමට ප්‍රතිපාදිත අරමුදලින් ගෙවීමට හෝ ඒ නමින් චෙක්පත් ලිවීමේ බලය හිමිවන නෛතික ප්‍රතිපාදන හා මෙම අරමුදලට අරමුදල් එකතු කිරීමේ අරමුදල් ප්‍රභවයන් හා ඒ සඳහා බලය හිමි වූ නෛතික ප්‍රතිපාදනයන් යන කරුණුවලට අදාල තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඌ) 2018 වර්ෂයේ සිට 2023 දක්වා පැවති වාහන අපහරණ ක්‍රියාවලිවලදී සුන්බුන් වශයෙන් අලෙවි කරන ලද වාහන 26 ක් අපහරණයට පෙර ඒවායේ ලියාපදිංචි අයිතිය අවලංගු කර තිබේද යන්න හා වාහනවල අයිතිය පැවරීම සඳහා වන එම්.ටී.ඒ 06 ආකෘති පත්‍රයේ පැවරුම්කරු විසින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙත භාර දිය යුතු පිටපත නිවැරදිව භාරදුන් බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

**1.6.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(අ) 2022 අංක 04/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විදුලි, ඉන්ධන, ජල හා දුරකථන බිල්පත් වල මාසික ඉතිරි කිරීම් පරීක්ෂා කිරීම සඳහා විශේෂ ක්‍රමවේදයක් පවත්වාගෙන යන බවට වූ ලේඛන ඉදිරිපත්කර නොතිබුණි. පිළිතුර මඟින් පාලන පරිපාටි හඳුන්වා දී ඇති බව දක්වා ඇතත් සාක්ෂි මඟින් තහවුරු නොවුණි. තවද මුදල් රෙගුලාසි 137(6) අනුව විදුලි හා ජල බිල්පත් මාසික මනු කියවීම් සහ අදාළ ලේඛන සමඟ සසඳා පරීක්ෂා කර අසාමාන්‍ය වෙනස්කම් විමර්ශනය කළ යුතු වුවද, රු.මිලියන 3,861 ක විදුලි හා ජල බිල්පත් සඳහා එවැනි පරීක්ෂාවක් හෝ සහතික කිරීමක් සිදු කර තිබූ බවට ලේඛනගත සාක්ෂි නොතිබුණි.

(ආ) ස්ථානමාරු මත පැමිණෙන හෝ නිදහස්වන නිලධාරීන්ට අදාළව අත්තිකාරම් "බී" ගිණුමේ නිරවුල් කළ යුතු හෝ අය කළ යුතු ශේෂයන් ඇතුළත් ණයගැති හා ණයහිමි ලේඛන යුද්ධ හමුදාව විසින් නඩත්තු කර නොතිබූ බැවින් සමලෝචිත වර්ෂයේ නිරවුල් කර ඇති ණයගැති ණයහිමි ශේෂවල නිරවද්‍යතාව තහවුරු නොවුණි.

2 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 | ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් ලද ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය කර නොතිබීම. | 1.6.1 |
| 3.7 (ආ) I,II | බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම් - 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට හා එම පනතට 2022 දෙසැම්බර් 28 දිනැති අංක 2312/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සිදු කරන ලද සංශෝධන අනුව කටයුතු නොකරීම. | 3.7 |
| 4.8 (ග) | Photocopy Machine 20 ක ප්‍රමාණය ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතීම. | 1.6.10 (ඊ) |
| 3.7 (අ) II | බලය නොලත් කාරක පාඩු | 3.4 |

3 මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) ප්‍රධාන උපකරණ නිවැරදිව සැපයීමේ අඩුපාඩු හා උපකරණ අක්‍රිය වීම හේතුවෙන් ලෙබනන්, සුඩාන් හා මාලි රාජ්‍යයන්ගෙන් 2023 සහ 2024 වර්ෂවල සාමාසාධක ආදායම් එ.ජ.ඩොලර් 310,690 ක් අහිමි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාලි මෙහෙයුමෙන් ආපසු ගෙන ආ වාහන හා උපකරණවලට සිදුවූ අලාභයේ ඇස්තමේන්තු වටිනාකම එ.ජ.ඩොලර්.126,982 ක් වූ අතර ඒ සඳහා වන්දි ලැබීමද අවිනිශ්චිතව පැවතුණි.

(ආ) රජයේ මුදල් මඟින් නඩත්තු වන නිවාඩු නිකේතනවල ආදායම් හා වියදම් වෙන වෙනම ගණනය නොකිරීම හේතුවෙන් එක් එක් නිකේතනයේ මූල්‍ය කාර්යසාධනය නිවැරදිව පරීක්ෂාකර බැලීමට නොහැකි වී තිබුණි. එසේම, අඩු ආදායම් ලබන නිකේතන පවත්වාගෙන යාමේ පිරිවැය හා ලාභදායීත්වය සංසන්දනාත්මකව ඇගයීමට විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි.

(ඇ) රජයේ භෞතික හා මානව සම්පත් උපයෝජනයෙන් බාහිර පාර්ශවයන් වෙත සපයනු ලබන සේවාවන් සඳහා උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් 2009 වර්ෂය සිට 2025 දෙවැනි කාර්තුව දක්වා රු.මිලියන 5,522 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

(ඈ) නිවාඩු නිකේතන, උත්සව ශාලා, හෝටල් සහ ආපන ශාලා සහ කෘෂි හා සත්ත්ව ගොවිපළ කටයුතු වලින් උත්පාදනය කරන ආදායමින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අගයට වඩා රු.මිලියන 150 ක් අඩුවෙන් බැර කර තිබුණි.

(ඉ) 2024 දෙසැම්බර් 31 සිට 2025 මාර්තු 31 දක්වා සන්නිවේදන කුළුණු 8 ක ගිවිසුම් අත්හිටුවා තිබූ අතර, නිමිකාරිත්වය වෙනස් වීම මත, ඇන්ටනා ගණන අනුව සැපයුම්කරුවන් සමඟ නව ගිවිසුම් හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් කුලී ආදායම සහ රජයට ලැබිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි.

**3.2 වියදම් කළමනාකරණය**

(අ) වියදම් අයිතම 13 ක කෙටුම්පත් ඇස්තමේන්තු වටිනාකමට වඩා අඩු ඇස්තමේන්තු වටිනාකමක් අනුමත කර තිබියදීත් රු.මිලියන 5,803 ක් එනම් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 5 සිට සියයට 32 දක්වා වූ ප්‍රතිශතයන් වෙනත් ඇස්තමේන්තු වෙත මාරු කිරීම මඟින් කෙටුම්පත් ඇස්තමේන්තු අධිගණනයක් සිදු වී තිබුණි.

(ආ) කෙටුම්පත් ඇස්තමේන්තු මඟින් එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වැය විෂය සඳහා රු.මිලියන 772 ක් ඉල්ලා තිබූ නමුත් රු.මිලියන 300 ක් පමණක් අනුමත කර තිබියදී මුදල් රෙගුලාසි 66 මඟින් රු.මිලියන 1,920 ක් මාරු කර තිබුණි. ඇස්තමේන්තුගත වටිනාකම් මෙන් සියයට 287 ක් වැය කිරීම මුදල් රෙගුලාසි නොතකා කටයුතු කිරීමක් මෙන්ම අනුමත ප්‍රමාණයට වඩා සියයට 640 ක අමතර ප්‍රතිපාදන ලබා ගැනීමක් විය.

(ඇ) වැටුප් හා වේතන වැය විෂය සඳහා රු.මිලියන 69,371 ක් කෙටුම්පත් ඇස්තමේන්තු මඟින් ඉල්ලා තිබුණු අතර ආහාරපාන හා නිල ඇඳුම් වැය විෂය යටතේ ආහාර සඳහා රු.මිලියන 34,443 ක් ද ආහාර සලාක දීමනාව සඳහා රු.මිලියන 47,555 ක් ද ලෙස එකතුව රු.මිලියන 81,999 ක් වශයෙන් කෙටුම්පත් ඇස්තමේන්තු සකස් කර තිබුණි. වැටුප් හා වේතන මෙන් සියයට 118 ක් ආහාරපාන හා නිල ඇඳුම් වැය විෂය යටතේ හමුදා නිලධාරියෙකුගේ ආහාර වෙනුවෙන් ඉහළ අගයක් ඇස්තමේන්තු කර තිබුණි.

(ඈ) නිල ඇඳුම් වැය විෂය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 15,047 ක් ඇස්තමේන්තු කර රු.මිලියන 7,000 ක් එනම් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 50 ට අඩු අගයක් අනුමත වී තිබුණි. මුදල් රෙගුලාසි 66 මඟින් සියයට 32 ක් එනම් රු.මිලියන 2,218 ක් ප්‍රතිපාදන ඉතා අසාමාන්‍ය ලෙස වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබුණි. පනත ප්‍රකාරව නිල ඇඳුම් ලබා දීමේ වගකීම ඉටු කිරීමෙන් තොරව ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කිරීම කෙසේ සිදුකළේද යන්න විගණනයට අනාවරණය කර ගැනීම සඳහා ගිණුම් මඟින් ඉදිරිපත් කළ තොරතුරු ප්‍රමාණවත් නොවීය.

(ඉ) පෙළඹවීමේ දීමනා ඇති කිරීම හා ගෙවීමේදී මුදල් රෙගුලාසි 71(අ) අනුව කටයුතුකර නොතිබුණි. තවද, යුද්ධ හමුදාව විසින් ගෙවන ව්‍යවස්ථාපිත දීමනා හැර අනෙකුත් සියලු දීමනා 222 ශීර්ෂය යටතේ වැය ලෙස ගිණුම්ගත කිරීමට පෙර මුදල් රෙගුලාසි අනුව නිසි අනුමැතිය ලබාගෙන ඇති බවට සාක්ෂි නොතිබුණි.

(ඊ) පෙර වර්ෂවලට සාපේක්ෂව ජනාධිපති සහ අගමැති ආරක්ෂක ඒකක සඳහා යොදවන යුද්ධ හමුදා නිලධාරීන්ගේ සංඛ්‍යාව සහ දීමනා සැලකිය යුතු ලෙස අඩු කර තිබුණද, ආරක්ෂක කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරී හා සෙසු නිල සැකැස්මක් සකස් කර තිබියදී විශේෂ පෙළඹවීමේ දීමනාව නොගෙවා අදාළ සේවා ලබා ගැනීම පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. තවද, 2022 ජූලි 11 දිනැති අංක MOD/5/2022/01/(104) දරන ආරක්ෂක ලේකම්ගේ ලිපිය අනුව ප්‍රභූ ආරක්ෂක රාජකාරි කරන ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 100 දෙනෙකුට පමණක් මෙම දීමනාව ගෙවීමටද අවධානය යොමු වී නොතිබුණි.

(උ) යුද්ධ හමුදාවට අනන්‍ය රෙදිපිළි, නිල ඇඳුම්, පදක්කම් සහ අනෙකුත් ආයිත්තම් සඳහා රේගුවෙන් විශේෂ HS කේත (HS Code) ලබා නොගැනීම හේතුවෙන්, බාහිර පාර්ශ්වයන්ටද ඒවා ආනයනය කිරීමට හා වෙළඳපොලේ අලෙවි කිරීමට අවස්ථාව ලැබී තිබුණි.

(ඌ) යුද්ධ හමුදා සුළු ප්‍රසම්පාදන කමිටු විසින් ප්‍රසම්පාදනයන් 19 ක් යටතේ රණවිරු ඇපරල් වෙත කොන්ත්‍රාත් ලබා දී මසා නිමකර ගත් නිමි ඇඳුම් 673,775 ක් සඳහා රු.මිලියන 641 ක් ගෙවීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.1.7 ට පටහැනිව කටයුතු කර තිබුණි.

(එ) යුද්ධ හමුදාවේ භෞතික හා මානව සම්පත් උපයෝජනයෙන් ක්‍රියාත්මක වන රණවිරු ඇපරල් ආයතන මඟින් මුදල් නොගෙවා හමුදාවට අවශ්‍ය කාර්යය ඉටුකර ගැනීමට අවධානය යොමු වී නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සමාලෝචිත වර්ෂයේ ඉන්ධන ඇස්තමේන්තුව සමස්තයක් වශයෙන් රු.මිලියන 5,007 ක් එනම් සියයට 45 ක අධි ඇස්තමේන්තු වටිනාකම් සකස් කර ප්‍රතිපාදන වෙන් කරවාගෙන පසුව එම ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කරමින් වියදම් සිදුකර තිබුණි.

(ඔ) ආහාර වැය විෂය යටතේ සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවේ ආහාර දීමනාව සඳහා රු.මිලියන 24,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද. සත්‍ය වියදම් රු. මිලියන 26,330 ක් වූයෙන් රු.මිලියන 2,330 ක් ඉක්මවා වියදම් කර තිබුණි.

### 3.3 වියදම් අතිරික්තය / අධිවැය

ගෙවීමේ පදනම් මත වෙනත් ආයතන වෙත ලබා දුන් ඉන්ධන සඳහා අදාළ මුදල් ලැබීමේ හෝ හර වවුවර් පත් නිරවුල් කිරීමේ ජර්නල් සටහන් නිවැරදිව සටහන් කළ පසු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වෙනත් කටයුතු සඳහා ඉන්ධන වැය විෂය යටතේ රාජ්‍ය උත්සව ආදී වෙනත් කටයුතු සඳහා වැය වූ ඉන්ධන වියදම් පමණක් සත්‍ය වියදම් වශයෙන් පෙන්විය යුතුය. නමුත් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර ඇති වියදම් රු.මිලියන 1,025 ක් වුවද ඒ තුළ ඇති රාජ්‍ය උත්සව ආදී වෙනත් කටයුතු සඳහා නිකුත් කරන ලද ඉන්ධන වටිනාකම් රු.මිලියන 487 ක් වූයෙන් රු.මිලියන 538 ක වැඩිපුර ඉන්ධන වියදමක් නිරීක්ෂණය විය.

### 3.4 බලය නොලත් කාරක පාඩු

අත්තිකාරම් ගිණුම් කටයුතු වලදී අපේක්ෂිත පාඩු සඳහා මුදල් රෙගුලාසි 15(6) හා මුදල් රෙගුලාසි 511(අ) ප්‍රකාරව කටයුතු නොකර රු.695,100 ක් මුදල් රෙගුලාසි 66 ප්‍රතිපාදන යටතේ මාරු කර තිබුණි.

### 3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය පාලන බලතල පැවරීමේදී මුදල් රෙගුලාසි 135(4) ප්‍රකාරව කටයුතු නොකර ඇතැම් වියදම් සම්බන්ධයෙන් අනුමත කිරීමේ සහ සහතික කිරීමේ කාර්යයන් ඉටුකරන වගකිවයුතු නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස පොදුවේ සඳහන් කර තිබුණි. මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය බලතල පැවරීමේ ලේඛනයෙහි බලය දීම සිදුවන චක්‍රලේඛ, ප්‍රසම්පාදන අධිකාරිය හෝ රෙගුලාසි නිශ්චිත ලෙස සඳහන් කළයුතු වුවද එසේ බලය ලැබෙන ආකාරය නිශ්චිතව සඳහන් නොකර මෙම ලේඛනය පිළියෙල කර තිබූ අතර මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව වවුවර් අනුමත කිරීමට බලතල හිමිවන්නේ කුමන නිලධාරියාටද යන්න හෝ පුද්ගලයා කවුරුන්ද යන්න නිශ්චිතව සඳහන් කළ යුතු වුවද එසේ සිදු නොකර අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයට/ අංශයට අනුමත කිරීමේ බලය ලබා දීමට මූල්‍ය බලතල පැවරීමේ ලේඛනයෙන් කටයුතු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව වවුවර ඝතික කිරීමට අදාළ බලතල හිමි නිලධාරියා නිශ්චිත ලෙස හඳුන්වා නොදීමෙන් සහතික කිරීමේ කාර්යයේ සත්‍යාපනය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාට වගකිවයුතු පාර්ශවයන් කවුරුන්ද යන්න තහවුරු කර ගත නොහැකි විය.

## 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය චක්‍රලේඛය | යුද්ධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව කළමනාකරණ පද්ධතියේ වත්කම් වර්ගීකරණය කර නොතිබුණි. |
| (ආ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව<br><br>2024 නොවැම්බර් 11 දිනැති 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කළ යුතු භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන අත්පොත | DOS/2025/4338 අංක දරන ප්‍රසම්පාදන ලිපි ගොනුවෙහි ඇතුළත් ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන අත්පොතෙහි මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය<br><br>2006 වර්ෂයේ නිකුත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2:14:1 සංශෝධිත වගන්තිය | යුද්ධ හමුදාව විසින් 2024 වර්ෂයේ හා 2025 ජුලි 21 දින දක්වා ප්‍රතිපූර්ණය කර ඇති රු. මිලියන 258 ක් වූ මිලදී ගැනීම් ලංසු ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමකින් තොරව, පැවරී ඇති බලතල අනුව වැයකර ඇති මුදල යුද්ධ හමුදා සුභසාධන අරමුදල වෙත ප්‍රතිපූර්ණය කිරීමට අනුමත කරන බව දක්වා ඇත. ඒ අනුව මිලදී ගැනීම් සියල්ල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වී නොමැති බවත්, 2.14.1 මාර්ගෝපදේශය මඟින් ලබා දී ඇත්තේ අදාළ මිලදී ගැනීම් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන අනුමැතිය නොවන අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර සිදු කර ඇති මිලදී ගැනීම් වලට අදාළව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අධිකාරී සීමාවන් පමණක් බව නිරීක්ෂණය විය. |
| (ඈ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>2024 ජනවාරි 10 නිකුත් කර ඇති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය,<br>2025 මාර්තු 22 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2025 | චක්‍රලේඛ මඟින් දක්වා ඇති වියදම් සීමා කිරීමේ නිර්ණායකයන් නොසලකා නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ තොරතුරු විවිධ උත්සව , විදේශ සංචාර සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ ගුවන් ටිකට්පත් බිල් සඳහා දරන වියදම් ,නායකත්ව පාඨමාලා, බක්මහ උළෙල හා රාත්‍රී භෝජන සංග්‍රහ සඳහා දරන ලද විවිධ වියදම් ආදිය 2024 හා 2025 වර්ෂයේ ජූලි මාසය දක්වා රු.මිලියන 50 ක් යුද්ධ හමුදාධිපති අරමුදලින් වැය දරා පසුව මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර තිබුණි. |

## 3.7 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට හා එම පනතට 2022 දෙසැම්බර් 28 දිනැති අංක 2312/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සිදු කරන ලද සංශෝධන අනුව APIT බදු ගණනයේදී 2025 දෙසැම්බර් මාසයේ සේවයේ නියුතු හමුදා නිලධාරීන් 1,101 දෙනෙකුට අදාළව එම මාසයේ මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ මත වැටුපෙන් අයවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රු.12,617,801 ක් විය. යුද්ධ හමුදාව විසින් සිදුකළ ගණනය කිරීම් අනුව එය රු.7,644,916 ක් වී තිබුණි. එම ගණනය කිරීම් තුළ 2025 දෙසැම්බර් මස ගෙවා නිබූ හිඟ වැටුප් රු.7,886,650 ක් නොසළකා හැරීමෙන් රු.1,723,824 ක් ද රු.3,249,061 ක මාසික බදු ආදායමක් ද රජයට අහිමි වී තිබුණි.ඒ අනුව APIT බදු නීතිය ප්‍රකාරව 2025 වර්ෂය සඳහා රු.38,988,732 ක් ඇතුළුව රු.40,712,556 ක පමණ සමස්ත බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

(අ) යුද්ධ හමුදාවේ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023, 2024 වර්ෂ දෙකේදී හා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දින දක්වා රු.මිලියන 509 ක් යුද්ධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන යුද්ධ හමුදාධිපති අරමුදලින් රු. මිලියන 4,218 ක් වෙනත් විවිධ අරමුදල් සඳහාද ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) යුද්ධ හමුදාධිපති අරමුදලින් සැපයුම් සේවා සිදු කිරීම මත කිසිදු වර්ගයේ මුදලක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතරම වවුචර්වලට ගෙවීම් කිරීමේදී අදාළ ගෙවීම් බලධාරියා විසින් එක් එක් සැපයුම් සේවා සපයා ඇති සැපයුම්කරු වෙනුවට යුද්ධ හමුදාධිපති අරමුදලට ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අදාළ සනාථ කිරීම් හෝ ලබා ගෙන නොතිබුණු අතර, අදාළ ව්‍යවස්ථාපිත නොවන අරමුදලින් සැපයුම් සේවා සිදු කිරීමට බලය දුන් නිලධාරීන් කවුරුන්ද යන්න හෝ තහවුරු කර ගැනීමට හා ඒවායේ නිත්‍යානුකූලබාවය තහවුරු කර ගැනීමකින් තොරව 2023, 2024 හා 2025 වර්ෂ තුනට අදාළව එකතුව රු.මිලියන 377 ක් අරමුදලට ගෙවීමට ගෙවීම් නිලධාරියා කටයුතු කර තිබුණි.

(ඇ) විගණනය විසින් DEF/A/SLA/INF/2024/64 දරන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් සිදු කරන ලද නොරතුරු කැඳවීම් ලිපියට අදාළව යුද්ධ හමුදාව සතුව රජයේ අරමුදල් යටතට ගැනෙන කිසිදු ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් නොමැති බවත්, යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ස්වකැමැත්ත පරිදි ලබාදෙන දායක මුදලින් ස්ථාපිත කර ඇති අරමුදල් ගණයට ගැනෙන සුභසාධන අරමුදල් 19 ක් පවතින බවත් 2024 දෙසැම්බර් 24 දිනැති පිළිතුරු ලිපිය මඟින් දක්වා තිබුණි. නමුත් යුද්ධ හමුදාව විසින් අරමුණු වලින් බැහැරව ආදායම් උත්පාදන කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන අරමුදල් රැසක් පැවතුණි.

(ඈ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකාරණ පනතේ 39(4) වගන්තිය, 2024 නොවැම්බර් 06 දිනැති අංක 04/2024 හා 2025 අප්‍රේල් 11 දිනැති අංක 1/2025(අරමුදල්) දරන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කළ චක්‍රලේඛයන් ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදල් නොවන වෙනත් අරමුදල් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට නොරතුරු වාර්තා කර නොතිබුණි.

(ඉ) ඒකාබද්ධ අරමුදලින් වියදම් පියවීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන විවිධ ව්‍යාපෘති හා කාර්යයන් වන දන්ත සේවා, ඉංජිනේරු සේවා හා යුද්ධ හමුදා රෝහල් සංවර්ධන කටයුතු ආදී කාර්යයන් සඳහාද වෙන වෙනම අරමුදල් පිහුටුවා තිබුණි. එම විවිධ අරමුදල් උපයෝගී කර ගනිමින් වියදම් සිදු කර ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කර ගැනීම සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත යොමු කර නෛතික ප්‍රතිපාදන සළසා ගැනීම මඟින් නීතියට අනුකූල වීමට කටයුතු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 2020 වර්ෂයේ සිට 2025 ජුනි දක්වා යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසු නිලයින්ගේ වැටුපෙන් විවිධ ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අවකරණ යටතේ රු.මිලියන 192,506 ක චටිනාකමක් අඩු කර තිබුණි. නීත්‍යානුකූල නොවූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සඳහා වැටුපෙන් අවකර කිරීම් සිදුකිරීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඇ) මුදල් රෙගුලාසි 380, 381 හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනතේ 35 වන වගන්තිය හා 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වක්‍රලේඛය අනුව නිල තනතුරු නාමයන් යටතේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් පිළිබඳ සම්පූර්ණ පාලනය භාණ්ඩාගාරය සතු වන බවත්, නිල නාමයන් යටතේ පාලනය වන බැංකු ගිණුම් හෝ එවැනි මූල්‍ය වත්කම් මහ බැංකු අධීක්ෂණය යටතේ පැවතිය යුතු බවත් අදහස් වේ. ඒ අනුව රජයේ වැටුප් ලබන රජයේ සේවකයින්/ නිලධාරීන් විසින් රජයේ මුදල් නොවන වෙනත් මූල්‍ය වත්කම් පාලනයට තනතුරු නිල නාමයන් භාවිතා නොකළ යුතු බවත්, ඒ සඳහා ඒ වෙනුවෙන් ස්ථාපිත කර ඇති ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කර ඇති ආයතනයක්/ අරමුදලක් නමින් අරමුදල් රැස් කිරීම් කළ යුතුව තිබුණි.නමුත් යුද්ධ හමුදාවේ නිල නාමයන් යටතේ බැංකු ගිණුම් 1346 ක් පමණ පවත්වාගෙන ගොස් තිබුණි. 2025 මැයි 20 දිනැති අංක බීඑන්/එන්පිඑෆ්/171/2 (15) ලිපිය ප්‍රකාරව බැංකු ගිණුම් 900 ක ශේෂ ලෙස 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 156,957 ක් පැවතුණි. එම මුදල් ශේෂ මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. තවද මෙම ගිණුම් ස්ථාපිත කර පවත්වාගැනීමට අදාළ අනුමැතිය, ඒ සඳහා යුද්ධ හමුදා සේවක මණ්ඩලය හා රජයේ දේපළ වත්කම් යොදා ගැනීමට අදාළ එකඟතාවයන් පිළිබඳව සාක්ෂි අනාවරණය නොවුණි.

### 3.9 බැංකු ගිණුම් මෙහෙයවීම

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2020 ඔක්තෝබර් 28 දිනැති අංක TD/BE2/4/UNINCOME/ARMY දරන ලිපිය අනුව යුද්ධ හමුදා භට පිරිස් විදේශ සාම සාධක රාජකාරිවල නියුතු වීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන ආදායමෙන් එ.ජ.ඩොලර්.1,299,480 ක මුදලක් බැංකු ගිණුමේ රඳවාගෙන ඉතිරි සියලුම මුදල් වහාම ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රේෂණය කරන මෙන්ද, එම ගිණුමේ අවශ්‍යතාවය ඉක්මවා රඳවා ගනු ලබන මුදල් ශේෂය මත මූල්‍ය පිරිවැයක් භාණ්ඩාගාරයට දැරීමට සිදු වන බැවින් අවම වශයෙන් සති දෙකකට වරක් හෝ මෙම ගිණුමේ ශේෂය පරීක්ෂා කර බලා අදාළ සීමාව ඉක්මවන අමතර මුදල් ප්‍රමාණය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට මාරු කිරීමට කටයුතු කරන ලෙසද දන්වා තිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 දිනට අදාළ ගිණුමේ බැංකු ප්‍රකාශනය අනුව එ.ජ.ඩොලර් 1,489,197.53 ක ශේෂයක් පැවතුණි. තවද, 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා බැංකු ගිණුම් ශේෂ පරීක්ෂා කිරීමේදී මාස 10 ක දී අදාළ රඳවා ගැනීමේ සීමා ඉක්මවා එ.ජ.ඩොලර් 2,055.34 සිට එ.ජ.ඩොලර් 1,374,245.16 ක් දක්වා වූ පරාසයකින් පැවතුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

(අ) යුද්ධ හමුදා පනතේ 155(1)(ඊ) වගන්තිය අනුව හමුදා පරිපාලනය වෙනුවෙන් නියෝග පැනවීමේ හැකියාව අමාත්‍යවරයාට ලබා දී ඇතිමුත්, මූල්‍ය පාලනය හා මූල්‍ය විනයට අදාළ කටයුතු සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බැවින් යුද්ධ හමුදාව තුළ පවතින අභ්‍යන්තර විගණන අංශ දෙකෙහි අරමුණු, පරමාර්ථ හා කාර්යන් ඊට අනුකූලවන පරිදි යළි සමාලෝචනය කළ යුතුව පැවතුණි.

(ආ) පනත මඟින් පැවරුනු කාර්යභාරය ඉටු කිරීමේලා තුල වාසි හා පිටත වාසි නිලධාරී සංකල්පය යළි සමාලෝචනය කරමින් හමුදාගත තත්ත්වය ස්ථාපිත කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි.

#### 4.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

2025 ජූලි 02 දිනැති 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 (4) වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අරමුදල් සමාලෝචන කමිටු වාර්තාව හි 6.1 ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගත යුතු අරමුදල් යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ ඇති ව්‍යවස්ථාපිත නොවන අරමුදල් දොළහක් දක්වා එම අරමුදල් සම්බන්ධයෙන්

කමිටුවේ නිර්දේශ සහ ක්‍රියාකළ යුතු නිලධාරියා දක්වා ඇතත් එහි නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි. 2025 දෙසැම්බර් 31 දින වන විටත් මෙම අරමුදල් මහින් ඉපයූ ආදායමින් ව්‍යවස්ථාපිත අරමුදලට බැර වූ මුදල් ශේෂ විගණනයට ඉදිරිපත් නොවුණි.

### 4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අනෙකුත් මූලධන වියදම් යටතේ ආදායම් උපදවනු ලබන ව්‍යාපෘති වැය විෂයෙහි භෞතික කාර්යසාධනය සියයට 25 ක අවම අගයක පැවතුණි.

### 4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දේශීය පුහුණු මධ්‍යස්ථාන 42 ක් මඟින් පුහුණු පාඨමාලා පවත්වා තිබූ අතර කාර්යසාධන වාර්තාව තුළ පුහුණු මධ්‍යස්ථාන 30 ක තොරතුරු පමණක් දක්වා තිබුණි. කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබූ පුහුණු පාසල් 30 මඟින් පුහුණු පාඨමාලා පැවැත්වීමේ කාර්යසාධනය අනුමත පුහුණු පාඨමාලාවන්ට සාපේක්ෂව සියයට 33 සිට සියයට 96 ක පරාසයක තිබුණි. ඉන් පුහුණු පාසල් 06 ක කාර්යසාධනය සියයට 33 ත් සියයට 69 ත් අතර අවම පරාසයක පැවතුණි, තවද පුහුණු පාසල් 07 ක කාර්යසාධනය අනුමත පාඨමාලා සංඛ්‍යාවෙන් පරිහාහිරව සියයට 22 ත් සියයට 105 ත් අතර පැවතුණි

(ආ) 2016 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දක්වා, වැඩ ආරම්භකර අවසන් නොකළ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1,180 ක් වන ඉදිකිරීම් 25 ක් තිබුණි.එම ඉදිකිරීම් 25 කාර්යසාධනය සියයට 3 සිට සියයට 90 ක පරාසයක පැවතුණි. ඉන් ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 850 ක් වන ඉදිකිරීම් 22 ක ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂය සිට 2022 අතර කාලය තුළ ආරම්භ කර ඇත. එනම් වසර 04 ත් 10 ත් අතර කාලයක් ගතකර තිබූ එම ඉදිකිරීම්වල කාර්යසාධනය සියයට 20 ත් සියයට 90 ත් අතර විය.ඒ අතුරින් කාර්යසාධනය සියයට 50 ට අඩු ඉදිකිරීම් ගණන දහයකි.

### 4.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය මඟින් 2024 වර්ෂයේ රු.15,000 ට වඩා වැඩි වටිනාකමින් යුතු අළුත්වැඩියාවන් 3,457 ක් සිදු කර තිබූ අතර අංක යුහ 90405 දරන සන්නද්ධ රථය, අංක යුහ 17088 දරන ජීප් රථය, අංක යුහ 22633 දරන ගිලන් රථය සඳහා පිළිවෙලින් රු.6,734,400, රු.268,100, රු.575,137 ක පිරිවැයක් දරා තිබූ අතර ඒ සඳහා පිළිවෙලින් වසර 15 , 13 හා 12 වශයෙන් ඉතා දිගු කාලයක් ගත වී තිබුණි.

### 4.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය, 2025 ඔක්තෝම්බර් 30 දිනැති අංක DEF/A/SLA/INF/2025/41A දරන ලිපිය මඟින් ඉල්ලා සිටියද විගණිත දිනය තෙක් තොරතුරු නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තා කෙටුම්පතේ ඇතුළත් ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4.2 ප්‍රසම්පාදනයන්

(අ) යුද්ධ හමුදා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම 2025 ප්‍රාග්ධන වියදම් යටතේ ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ වැය විෂය සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. Drawing Room SOFA සඳහා රු.මිලියන 8 ක ප්‍රතිපාදන පමණක් වෙන් කර තිබුණද මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කළ තොරතුරු ප්‍රකාරව ඒසිඒ - 6 ආකෘතියේ ලී බඩු උපකරණ කේතයට සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 30 ක SOFA වටිනාකමක් ප්‍රාග්ධනිත කර තිබුණි. එය ඇස්තමේන්තු වටිනාකම මෙන් සියයට 360 ක අගයකි. සමාලෝචිත වර්ෂයේ සෝෆා මිලදී ගැනීම් තුළ Sofa set (3:2:1) With Coffee table මිලදී ගැනීමේදී අදාළ පිරිවිතර මිනුම් වලට වඩා අඩු මිනුම් යටතේ කරන ලද සැපයීම් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. තවද බිල්පත් නිරවුල්ව

කිරීමේදී යහපත් පාලන ක්‍රමයක් නොවන තිල මුද්‍රාව සහිත ලිපි ලේඛන 02 බැගින් ලබා ගෙන ගෙවීම් කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන ලිපි ගොනු අංක DOS/2025/4338 මඟින් ප්‍රසම්පාදනයන් කරන ලද Bio Chemistry Analyzer Fully Automated යන්ත්‍ර ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.5 මාර්ගෝපදේශය අනුව, ප්‍රසම්පාදනය සඳහා කාල සටහනක් සකස් කර තිබුණද, එය ආරම්භයේ සිට සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කර නොතිබූ බැවින්, ප්‍රසම්පාදන කාල සටහන සකස් කිරීමේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට යුද්ධ හමුදාව අපොහොසත් වී තිබුණි.

(ii) ප්‍රසම්පාදන සැළසුම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.8 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකර ඇණවුම් නිකුත් කිරීම තෙක් සම්පූර්ණ කාලය දින 128 ක් ලෙස සැලසුම් කර තිබුණි . එමෙන්ම යුද්ධ හමුදාව විසින් පිළියෙල කර ඇති ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිල ගණන් කැඳවූ දින සිට ප්‍රසම්පාදන තීරණය ලබා දීම සඳහා සමස්ත කාලය දින 97 ක් වුවද, මේ සඳහා දින 210 ක් ගත කර තිබුණි.

(ඇ) පිරිවිතරයන්ට සිදු කරන ලද සංශෝධනයන්ට අනුව 50 වන පිරිවිතරය මඟින් යුද්ධ හමුදා රෝහල්වල දැනට පවත්නා LIS හා HIMS පද්ධතීන්ට සම්බන්ධ කිරීමට අදාළ තාක්ෂණික නිර්ණායක විවෘත හා තරඟකාරී ආයතනයකින් ලබා ගැනීමට වඩා නිශ්චිත සමාගමකින් හා පුද්ගලයකුගෙන් ලබා ගන්නා ලෙස දැක්වීම මත එම ආයතනය පිළිබඳ අනවශ්‍ය පක්ෂපාතීත්වයක් ඇති කිරීමට හා ප්‍රසම්පාදන නියමයන් උල්ලංඝනය කරමින් දැනට හමුදා රෝහල් පද්ධතියේ සැපයීම් සිදුකරන සමාගමක්/පුද්ගලයකු සමඟ ව්‍යාපාරික එකඟතාවයක් ඇති කර ගැනීමට පුර්ව ලංසු රැස්වීමේදී කටයුතු කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 මාර්ගෝපදේශ හා අත්පොතහි දක්වා ඇති කරුණු 06 ඇතුළත්ව ප්‍රසම්පාදන දැන්වීම් පළකර නොමැති අතර ඒ තුළ පුළුල් ප්‍රචාරයක් ලබා දීම මඟින් අපේක්ෂිත ලංසුකරුවන් ආකර්ෂණය කර ගැනීමටත්, ප්‍රමාණවත් තරඟයක් ඇති කරමින් සාධාරණ මිල තරඟයක් ඇති කිරීමට යුද්ධ හමුදාව කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන අත්පොතෙහි 6.2 මාර්ගෝපදේශය අනුව කටයුතු නොකර ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රකාරව මිල ගණන් 2025 ජුනි 01 දින සිට ජුනි 22 දක්වා නිකුත් කරනු ලබන බවත්, ලංසු වැසීම හා විවෘත කිරීම 2025 ජුනි 25 දින සිදු කරන බව දක්වා තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.4(ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකර යුද්ධ හමුදාව එදිනට විවෘත කිරීමට නියමිත සියලුම ප්‍රසම්පාදනයන්ට අදාළව පොදු මුද්‍රා තැබූ ලංසු පෙට්ටියක් භාවිතා කරනු ලබන අතර, එදිනට පැමිණෙන සියලුම ලංසුකරුවන් ඉදිරියේ විවෘත කිරීමට හා ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම තුළ ප්‍රසම්පාදනයේ රහස්‍යභාවය උල්ලංඝනය වී තිබුණි.

(උ) ප්‍රසම්පාදන ලිපි ගොනු අංක DOS/2025/5301 හා 5302 මඟින් රු. මිලියන 65 ක CORE I 3 සහ Core I 05 වර්ගයේ ඩෙස්ක්ටොප් පරිගණක 300 ක් සඳහා ප්‍රසම්පාදනය කර තිබුණි. නමුත් එම පරිගණක යන්ත්‍ර 2021 වර්ෂයට පෙර භාවිතයේ පැවති නමුත් නූතන තාක්ෂණය සමඟ යාවත්කාලීන නොවූ Genaration 5 & 8 වලට අයත් විය. නවීන තාක්ෂණය හා බැඳී පවතින ඇතැම් මෘදුකාංග හා AI Tools ක්‍රියාකරවීමට පහසුකම් එම පරිගණක සතු නොවන බැවින් ඒවා නූතන තාක්ෂණයට ගැලපෙන අයුරින් යාවත්කාලීන කිරීම සඳහා විශාල අමතර පිරිවැයක්ද දැරීමට සිදු වී තිබුණි.

(ඌ) 2025 ජනවාරි 01 දිනැති හාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 4.1.3 (ආ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාහන වැය විෂය යටතේ සැහැල්ලු හා බර වාහන සඳහා රු.මිලියන 700 ක ප්‍රසම්පාදනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්ෂික ප්‍රාග්ධන ප්‍රසම්පාදන සැළැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

(අ) ප්‍රසම්පාදන ලිපි ගොනු අංක DOS/2025/4338 මඟින් ප්‍රසම්පාදනය කරන ලද Bio Chemistry Analyzer Fully Automated යන්ත්‍ර මිලදී ගැනීම තුලින් පර්යේෂණ 14 ක් සිදු කිරීමට යුද්ධ හමුදාව අපේක්ෂා කරන අතර, අදාළ රෝහල් 03 න් සිදු කිරීමට අපේක්ෂිත පරීක්ෂණ පිළිබඳව සලකා බැලීමේදී මුළු පරීක්ෂණ වලින් සියයට 35 ක් Glucose පරීක්ෂාවද, සියයට 29 ක් Total Cholesterol පරීක්ෂාවද, සියයට 8 බැගින් HDL, LDL Cholesterol හා Triglyceride පරීක්ෂාවන්ද සිදු කිරීමට අපේක්ෂා කළද, ඉතිරි සියලු පරීක්ෂාවන් සියයට 3-0 අතර, පැවතුණි. ඒ අනුව රෝහල් තුන සඳහා යන්ත්‍ර ගැනීමේ පරමාර්ථය සීමිත පරීක්ෂණ සංඛ්‍යාවක් ඉටුකර ගැනීම පමණක් විය.

(ආ) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල් ගේ "රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 ඡේදයේ මුදල් රෙගුලාසි 770 (4) (ඉ) යටතේ රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාළ මාර්ගෝපදේශය" මැයෙන් වූ මාර්ගෝපදේශයේ 8.7 කරුණ හා 2018 ඔක්තෝබර් 10 දිනැතිව නිකුත් කරන ලද අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල අබලි වාහන ලෙස අපහරණය කර ඇති නමුත් මේ වන තුරුත් ලියාපදිංචි අයිතිය අවලංගු කර නොමැති සියලු වාහන නීත්‍යානුකූල ක්‍රමවේද අනුගමනය කරමින් ලියාපදිංචිය අවලංගු කිරීමේ කටයුතු සිදු කළ යුතු අතර යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන යුධ සමයේ අත්පත් කර ගත් වාහනවල අයිතිය නිරවුල් කිරීමේ කටයුතු ද චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් සිදු කළ යුතුව පැවතුණි.

(ඇ) යුද්ධ හමුදාව විසින් 2023 වර්ෂයේ වාහන 116 ක් හා සමලෝචිත වර්ෂයේ වාහන 40 ක් අපහරණය කිරීමේදී විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමකින් තොරව අපහරණ කටයුතු සිදු කර තිබුණි.

(ඈ) යුද්ධ හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් කළමනාකරණ පද්ධතියේ සඳහන් වත්කම් වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන (ඒසිඒ 06 ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ සඳහන් වත්කම් වටිනාකම් අතර වෙනස්කම් පැවති නමුත් එම වෙනස්කම් නිරවුල්ව හඳුනාගැනීමේ හැකියාවක් නොතිබුණි.

## 4.4 පාඩු හා හානි

අලාභ හානි සිද්ධීන් 230 කට අදාළව රු.මිලියන 13,196 ක අලාභයක් පැවති අතර එය අයකර ගැනීම හෝ කපා හැරීම මන්දගාමී ස්වරූපයක පැවතුණි. එමෙන්ම වර්ෂය තුළ පොත්වලින් කපා හැරීමට නියමිතව තිබූ අලාභ හානි වටිනාකම් අතුරින් ඇතැම් වටිනාකම් සම්පූර්ණයෙන්ම මහහැරී තිබූ අතර ඇතැම් වටිනාකම් පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වෙනස් අගයකින් දක්වා තිබුණි.

## 4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 ජුනි 05 දිනැති අංක අවිඅම/විවි/2025/13/178(08) දරන ලිපිය මඟින් පෙන්වාදුන් රු.මිලියන 5 ට වඩා වැඩි වියදම් දරමින් ප්‍රතිනවීකරණය කිරීම්, නව මාදිලියකට වැඩි දියුණු කිරීම් හා මූලික අලුත්වැඩියාවක් සිදුකළ බව දක්වා ඇති වාහන 08 සඳහා එවැනි ස්වභාවයේ වෙනසක් කිරීමට අවශ්‍ය අධිකාරී බලය තහවුරු කර ගැනීමට අදාළ ලිපිගොනු හා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

## 4.6 කළමනාකරණ දුර්වලතා

(අ) දීර්ඝ කාලයක් අලුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් වාහනය එකම ස්ථානයේ රඳවා තබාගැනීම හේතුවෙන් දැරීමට සිදුවන හා සේවා කිරීම් නිසි පරිදි සිදු නොකිරීම නිසා ඇතිවන අමතර පිරිවැය පිළිබඳවද අවධානය යොමු කර රාජ්‍ය වියදම් පාලනය කර ගැනීමට උපකාර විය හැකි වාහන ඇණිය (Vehicle Fleet) හා එහි වාර්ෂික ධාවන නඩත්තු පිළිබඳ ඇගයීමකින් යුතුව අවශ්‍යතා හඳුනාගෙන පොදු පාලන පරිපාටි විමසුමක් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි.

(ආ) ගෙවීමේ පදනම මත වෙනත් ආයතන වෙත ලබා දුන් ඉන්ධන සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වටිනාකම රු.මිලියන 25 ක් වූ හර වවුචර් පත් ප්‍රමාණයක් 2026 පෙබරවාරි 28 වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පාඨමාලාව සාර්ථකව අවසන් නොකරන හෝ සේවා කොන්දේසි සම්පූර්ණ නොකර ස්වේච්ඡාවෙන් ඉවත්වන කැඩෙට් නිලධාරීන්ගෙන් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු දැනට නඩු පවරා ඇති නිලධාරීන් 15 දෙනෙකුට අදාළ රු.මිලියන 4 ක මුදල සහ නඩු පැවරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති නිලධාරීන් හැත්තැතුන් දෙනෙකුගෙන් අයවිය යුතු බැඳුම්කර මුදල් එකතුව රු.මිලියන 36 ක් අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් අයකර ගැනීම ප්‍රමාද වී තිබුණි.

## 5 තිරසාර සංවර්ධනය

තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා යුද්ධ හමුදාවේ ක්‍රියාත්මක කර ඇති අරමුණු තුනක් යටතේ ඇති ඉලක්ක 16 ක සමලෝචිත වර්ෂයේ භෞතික ප්‍රගතියට ළඟා වීම සියයට 50 කට වඩා අවම මට්ටමක පැවතුණි.

## 6 යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

(අ) 2016 වර්ෂයේ පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ උපදෙස් ප්‍රකාරව පිහිටුවන ලද අභ්‍යන්තර විගණන (සිවිල්) ඒකකය යුද්ධ හමුදා සංවිධාන ව්‍යූහයට එම අංශය ඇතුළත් කර යාවත්කාලීන කරන ලද සංවිධාන සටහන, සමලෝචිත වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

(ආ) යුද්ධ හමුදා නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය සංවිධාන ව්‍යූහය අනුව අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ යටතේ ස්ථාපිතකර තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33 (1) වගන්තිය හා මුදල් රෙගුලාසි 134 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 6.2 විගණන හා කළමනාකරණ කමිටුව

2025 අප්‍රේල් 28 දිනැති අංක DMA/01/2025 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු වක්‍රලේඛයේ ප්‍රකාරව දෙපාර්තමේන්තුවක විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතියත් යුද්ධ හමුදාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතියත් අතර අනනුකූලතාවක් පැවතුණි.

## 7 මානව සම්පත් කළමනාකරණය

2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 02/2018 හි 04 ඡේදය ප්‍රකාරව ආයතනයට සුවිශේෂී වූ මානව සම්පත් සංවර්ධන සැළැස්මක් සකස් කළ යුතු බව දක්වා තිබුණද යුද්ධ හමුදාව විසින් සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැළැස්මක් විගණනයට ඉදිරිපත් නොවුණි.

### 7.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයේ සමස්ථ පුරප්පාඩු 3,810 ක් පැවතුණද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හේතුවෙන් විවිධ පරිපාලන දුෂ්කරතා මතු වී තිබුණි.

(ආ) සිවිල් පරිපාලන අධ්‍යක්ෂ තනතුර 2021 මැයි 20 දින සිට පුරප්පාඩුව පවතින අතර, මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත්කිරීමට කටයුතු කර නොතිබීම සිවිල් පරිපාලන කටයුතු උපරිම කාර්යක්ෂමතාවයකින් සිදුකරගෙන යාමට බාධාවක් වී තිබුණි.

(ඇ) 2016 ජුනි 24 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ප්‍රකාරව ස්ථාපිත කරන ලද ප්‍රධාන අභ්‍යන්තර විගණන (සිවිල්) කාර්යාලය සඳහා නිළධාරීන් 38 දෙනෙකුගේ අවශ්‍යතාවය පැවතුණි. නිලධාරීන් 05 දෙනෙකුගේ අනුමැතියෙන් පමණක් ආරම්භකර තිබූ එම අංශය ස්ථාපිත කර වසර 09 ක් ගතවන තුරුන් අවශ්‍ය නිධාරීන් ප්‍රමාණය නැවත සමාලෝචනය කර සුදුසු පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ මාණ්ඩලික රාජකාරිගේ 2025 අප්‍රේල් මස 24 දිනැති අංක මාරාඅම/ප්‍ර/සංඛ්‍යා/විගණන (64) දරන ලිපිය අනුව හා 2026 පෙබරවාරි 26 දිනැති මාරාඅම/ප්‍ර/සංඛ්‍යා/විගණන (06) දරන ලිපිය අනුව සේවක සංඛ්‍යාව පිළිබඳ සඳහන් තොරතුරුවල පරස්පරතාවයක් පැවතුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන සැළැස්මෙහි ඇතුළත් මානව සම්පත් පැනිකඩෙහි සඳහන් තොරතුරු ද ලිපියේ සඳහන් තොරතුරු සමඟ විචලනයක් පැවතුණි. ඒ අනුව එම තොරතුරු මානව සම්පත් පිළිබඳ නිවැරදිව යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියකින් ජනනය කරන ලද තොරතුරු නොවුණි.

(ඉ) ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ 2020 ජූලි 15 දිනැති අංක MOD/01/2020 චක්‍රලේඛය ප්‍රකාරව යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා එසේ නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් හෝ ත්‍රස්ත ක්‍රියා මැඩ පැවැත්වීම් උදෙසා සිදු කරන ලද ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා, පොලිස් හෝ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සඳහා ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණවන තෙක් ගෙවන ලද වැටුප් හා දීමනා, මියගිය සාමාජිකයාගේ යැපෙන්නන් ජීවත්ව සිටින තෙක් හා ආබාධිත සාමාජිකයා ජීවත්ව සිටින තෙක් ලබා දීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව අදාළ ත්‍රිවිධ හමුදා සාමාජිකයා විශ්‍රාම ගන්වන අවස්ථාවේදී අවසන් වරට ලැබූ වැටුප් හා දීමනාවල එකතුව හා විශ්‍රාම ගන්වන අවස්ථාවේදී හිමි විශ්‍රාම වැටුප අතර වෙනස ස්ථාවර දීමනාවක් ලෙස විශ්‍රාම වැටුපට එකතු කර ගෙවිය යුතු බව දක්වා තිබුණි. නමුත් විවිධ චක්‍රලේඛ මඟින් වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගන්වනු ලැබූ යුද්ධ හමුදා සාමාජිකයින් 572 හට ස්ථාවර දීමනාව ගෙවීමට කටයුතු කර නොතිබුණි.

කේ.කේ.එස් ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට